

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**


| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 බක් මස පුරපසළොස්වක ද<br>ක්‍රි.ව. 2015 අප්‍රේල් මස 03 වන ද** | **12 වන කලබ** |


# හොඳ ළමයා

පාට සුවඳ එක වගේ
තිබෙන රෝස මල වගේ
කීකරු පොඩි ළමය ගේ
කවුරුත් පවසති අගේ

මව් පියන්ට ගුරුවරුන්ට
ගුණවත් වැඩි මහල්ලන්ට
කීකරු වන පොඩිත්තන්ට
පුළුවනි ලොව බබළවන්ට

මල්වල සුමිහිරි පැණි
ඇද බොන බමරා මෙනි
හොඳ ළමයා නුවණිනි
හොඳ දේ තෝරා ගනී

**- ටිබෙට් එස්. මහින්ද හිමිපාණෝ**



# අෂ්ට ලෝක ධර්ම

(වජිරාරාමාධිපතිව වැඩ විසූ අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ ලියූ The Buddha and His Teachings නම් කෘතියෙන් උපුටා පරිවර්තනය කරන ලද ලිපියකි.)

## කීර්තිය හා අපකීර්තිය

කීර්තිය (යසස) - ජීවිත කාලය තුළ අපට මාරුවෙන් මාරුවට මුහුණ පාන්නට වන තවත් ලෝ දහම් යුගලයක් සේ අයස හා යසස් දක්වෙයි. කීර්තියට අපි කැමති වෙමු. අපකීර්තිය නො රුස්සමු. කීර්තිය නිසා ප්‍රීතියෙන් උදම් වන අපි අපකීර්තියෙන් ශෝකයට හා ඉච්ඡාභංග යට පත්වෙමු. ප්‍රසිද්ධිය හා ජනප්‍රියත්වය ලබන්නට අපි රුචි වෙමු. පුවත්පත්වල අපේ නම හා පින්තූර පළ වනු දකින්නට අපි ආශා කරමු. අප ගේ සුළු සුළු කටයුතු වුව ද, එතරම් වැදගත් නැතත් ප්‍රසිද්ධ වනු දක්මට, අනවශ්‍ය තරමේ වුවත් ප්‍රචාරයක් ලබනු දක්මට අපි ප්‍රිය වෙමු.

පත්තරයක සඟරාවක ඡායාරූපය පළ කර ගන්නට ඕනෑම වියදමක් කරන්නට කැමති අය බහුල ය. නම්බු නාමයක් ලබා ගැනීම සඳහා අල්ලසක් දීමට හෝ බලයේ සිටින පක්ෂයට විශාල මුදල් ආධාරයක් කරන්නට සමහරු සූදනමින් සිටිති. සමහරු ප්‍රසිද්ධිය තකා,

තමාගේ දනපතිත්වය ප්‍රකට වන පරිදි සියයක් නමේ දහස් නමේ මහ දන් පවත්වති. එහෙත් අහල පහළ වසන දුගී දුප්පත්කමින් මිරිකෙන අසරණයාගේ දුක් ගිනි නිවන්නට තඹ සතයකුදු වෙන් කරන්නට කැමති නො වෙති. කුසගිනි දරා ගත නොහැකිව තම වත්තෙන් පොල් ගෙඩියක් සොරකම් කළ දුගියකුට දඬුවම් පමුණුවන්නට පෙළඹෙන සමහරු නම ප්‍රසිද්ධ කර ගැනීම සඳහා පොල් ගෙඩි දහස් ගණනක් පරිත්‍යාග කරන්නට මැළි නො වෙති.

මේවා මිනිස් දුබලකම් ය. බොහෝ අය හොඳ වැඩ කරන්නේ ද යටි අදහස් ඇතිව ය. නිරාමිෂාධ්‍යාශයෙන් ක්‍රියාකරන ආත්මාර්ථකාමිත්‍වයෙන් තොර පුද්ගලයෝ ලොව ඉතා දුර්ලභ වෙති. අරමුණ එතරම් ප්‍රශංසනීය නොවුව ද හොඳ වැඩ කරන අයට කළ යහපත් ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රශංසා කළ යුතු ය. බොහෝ පෘථග්ජනයන් ගේ සිත් තුළ යටි අරමුණු තිබේ. එහෙත් සියයට සියයක් ම යහපත් නිවැරදි අය සොයා ගත හැකි ද? පරම පවිත්‍ර චේතනාවෙන් ම වැඩ කරන්නෝ කීයෙන් කීදෙනෙක් අපට හමුවෙත් ද? හුදෙක් පරාර්ථකාමී චේතනාවෙන් ම ක්‍රියා කරන්නෝ කීයෙන් කී දෙනෙක් ද? කෙසේ වුව ද කීර්ති ප්‍රශංසා පසු පස හඹා යෑම අවශ්‍ය නැත. ඒවා අප පසු පස ආ යුතු ය. පැණි පිරුණු කුසුමට බමරා ඇදෙයි. කුසුම බමරාට ආරාධනයක් කරන්නේ නැත.

අපගේ කීර්තිය හොඳ නම හැම තැන පැතිරෙන විට අපට ප්‍රීතියක් ඇති වන බව සැබෑ ය. එහෙත් සියලු කිත් පැසසුම්, ගරු සැලකිලි තාවකාලික බව අප තේරුම් ගත යුතු ය. ඒවා හුදෙක් සුළඟේ පාවෙන අරුත් සුන් වචන පමණි. කනට ප්‍රිය වුවත් ඒවායේ ඇති හරය කුමක් ද?

අපකීර්තිය ගැන අපේ ආකල්පය කුමක් ද? අපකීර්තිය කනට හා සිතට වේදනා දනවයි. විශේෂයෙන් ම පදනම් විරහිත අසත්‍ය වාර්තා මුල් කරගෙන පැතිරෙන අපකීර්තිය වඩාත් සිත් තැවුල් ඇති කරයි.

මනරම් මහා මාලිගයක් නිර්මාණය කරන්නට සාමාන්‍යයෙන් වසර ගණනක් ගත විය හැක. එහෙත් නූතන ප්‍රබල යුද්ධෝපකරණ භාවිතයෙන් එවන් මහා මන්දිරයක් විනාශ කිරීමට ගත වන්නේ මිනිත්තු ගණනකි. කීර්ති නාමයක් ගොඩනගන්නට ද වසර ගණනාවක් ඇතැම් විට ජීවිත කාලයක් ගත වෙයි. එහෙත් එසේ අමාරුවෙන් ඇති කරගත් කීර්තිය විනාශ කිරීමට එතරම් වැඩි වේලා ගතවන්නේ නැත. යමකුගේ කීර්තිය ගැන කතා කරන තැනකදි ''ඒක නම් සැබෑ තමයි ඒ වුණත්.....යි'' හොඳ නම වනසන යමක් එකතු කරන්නට පෙළඹෙන අය සුලබ ය. ''ඒ වුණත්'' යන විෂම වචනයෙන් මහත් විනාශයක් කළ හැකි ය. නින්ද අපහාස, අවලාදවලින් බේරී සිටින්නට බුදුන්, රහතුන්ට වත් බැරි බව තේරුම් ගත යුතු ය.

ලොව විසූ අතිශයින් ම කීර්තිමත් ශාස්තෲන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වුව ද, එසමයෙහි වැඩියෙන් ම නින්ද අපහාස ලද්දේ ද උන්වහන්සේ ම ය. ලොව බොහෝ උදර මනුෂ්‍යයන් ගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනාගනු තේරුම් ගනු - නොලැබිණ. ඔවුන් හඳුනාගනු ලැබ ඇත්තේ බොහෝ විට වැරදියට ය. බුදුරදුන් ගේ ප්‍රතිපාක්ෂිකයෝ රාත්‍රි කාලයට උන්වහන්සේ ගේ ගන්ධකුටියෙහි කාන්තාවක සිටි බවට බොරු ප්‍රචාරයක් කළහ. අන්තිමේ දී ගණිකාවක මරා

පරමල් ගොඩේ සඟවා ඇය මරා දමන ලද්දේ බුදුරදුන් හා ශ්‍රාවකයන් විසිනැයි පැතිරවූහ. මෙසේ බුදුරදුන්ගේ හොඳනම කෙලෙසන්නට ඔවුන් පෙළඹුණේ උන්වහන්සේ ගේ ධර්ම ප්‍රචාරක කටයුතු සාර්ථක වී දහස් ගණන් ගිහි පැවිදි ශ්‍රාවකයන් ඇති වී බුදුසසුන ජනප්‍රිය වීම නොරිස්සූ හෙයිනි. බුදුරජාණන් වහන්සේ, මවුපියන් වෙතින් දරුවන් පැහැර ගන්නා, තරුණ බිරින්දන් කණවැන්දුම් කරන මායා කාරයකු වශයෙන් ද හඳුන්වන ලදි.

මේ සියලු කුමන්ත්‍රණ නිසරුව යද්දී උන් වහන්සේගේ ම මස්සිනා වූ දෙව්දත් බුදුරදුන් මතට ගලක් පෙරළා මරා දමන්නට යත්න දැරී ය. එහෙත් බුදු මහිමයෙන් ම උන් වහන්සේගේ ජීවිතය රැකිණි. නික්ලේශී බුද්ධාදි උත්තමයන්ට මෙබඳු තත්ත්වයන්ට මුහුණපාන්නට වන්නේ නම්, සාමාන්‍ය පෘථග්ජනයන් ගැන කියනුම කවරේ ද?

ඔබ කන්දක් මුදුනට නඟින විට ඉහළට නගින්නට නගින්නට ඔබ කැපී පෙනේ. ඔබ කුඩාවට අන්‍යයන්ගේ ඇසට මනාව ලක් වෙයි. එහෙත් ඔබේ පසු පස මිස මුහුණ පෙනෙන්නේ නැත. වැරදි සොයන ලෝකයා ඔබේ අඩුපාඩු දුබලතා මිස, ඔබේ යහපත් ගුණාංග දකින්නේ නැත. කුල්ලෙන් පොළන විට දහයියා විසි වෙයි. හාල් ඇට කුල්ලේ ඉතිරි වෙයි. එහෙත් පෙරහන මිහිර යුෂ ඉවතලා රොඩු ඉතිරි කර ගනියි. හොඳ හැදියාවක් ඇති අය උතුම් දේ ඉතිරි කරගෙන රොඩු ඉවත ලති. නැහැදුණු මිනිස්සු කුණු රොඩු එකතු කරති.

අපකීර්තිය - හිතාමතා හෝ නොහිතා යමකු ඔබ වරදවා තේරුම් ගෙන නැති අගුණ කියමින් අපකීර්තියට පාත්‍ර කරන විට කළ හැක්කේ කුමක් ද? එපිකියුරස් නම් දර්ශනිකයා ප්‍රකාශ කළේ ''එයා මාව හොඳටම දන්නෙ නැති නිසා ඔය විදියට සුළු අවමානයක් කරනවා. මගේ හැටි නියමෙට දැන ගත්තොත් ඔහොම නෙමේ, මාව විනාශ කරයි'' යනුවෙන් සිතා ගැනීම හොඳ බව ය.

මිනිසුන් අප ගැන කියන දෝෂාරෝපණ කතන්දර නිවැරදි කරන්නට ඉතා ම අවශ්‍ය වේලාවක අවශ්‍ය ම නම් පමණක් මිස වෙහෙස මහන්සි වීමේ අර්ථයක් නැත. ඔබ වේදනාවට පත්වනු දැකීමෙන් සතුරා කුරිරු සතුටක් ලබයි. ඔහුගේ අරමුණ එය ය. ඔබ කම්පා නොවී මැදහත් ව සිටියහොත් ඔහු ගේ අපහාස බීරි අලියාට වීණා වාදනය කළාක් මෙන් වෙයි. අනුන් ගේ වැරදි අපට පෙනෙන විට අප කළ යුත්තේ ඇස නොපෙනෙන්නන් ලෙස නෙත් වසා ගැනීම ය. යමකු අනුන්ගේ වැරදි කතා කරන තැන්වලදී ගොළුවන් සේ සිටීම යහපත් ය.

බොරු චෝදනා, කට කතා, අපහාස ආදිය නවත්වන්නට කිසිවකුට නොහැකි ය. ලෝකය සුදු වැලිවලින් පමණක් නොව උල් කටු, නිදිකුම්බා වැනි දෙයින් ද පිරී ඇති බව තේරුම් ගත යුතු ය. කටු කොහොල් දුර හැර ලොව එක ම සිනිඳු සුදු වැලිතලාවක් කරගන්නට කිසි කලෙක හැකි වන්නේ නැත. අපට කළ හැකි එක ම දේ කටු ඇනගන්නේ නැතිව පරෙස්සමෙන් ඇවිදීම ය. පාවහන් සඟලක් පැළඳ ගන්නේ නම්, කරදරයක් නැතිව කොතනත් ඇවිදින්නට හැකි ය.

"සිංහයකු වගේ බිය නැති - කිසි හඬකට යන පෙරටම
දූලක නොපැටලී හමනා - සුළඟක් සේ එක දිගට ම
පියුමක් මෙන් මඩේ පිපෙන - මඩ බිඳකුත් නොතැවරීම
කඟවේනෙක් වගේ යන්න - ඉදිරියට ම ඔබ තනි ව ම"

වනයෙහි රජු නිසා සිංහයා නිර්භීත ය. වෙනත් සතුන් ගේ නාදවලට සිංහයා කලබල නො වෙයි. ලොව ජීවත්වන අපට ද වාචාල අසංවර පුද්ගලයන් ගේ බොරු වාර්තා, අභූත චෝදනා, අවලාද කතා ඕනෑ තරම් අසන්නට ලැබේ. අප ද සිංහයන් මෙන් ඒවා කනට නෑසුණා මෙන් සිටිය යුතු ය. බූමරංගයක් මෙන් ඒවා කියන්නන් වෙත ම ආපසු යනු ඇත. ''බල්ලන් බුරනවා - තවලම ඔහේ යනවා'' යන කියමන ඔබ අසා ඇත. අප ජීවත්වන ලෝකය මඩ වගුරක් වැනි ය. එහි අප්‍රමාණ නෙළුම් මල් හටගනු ඇත. මඩ නොතැවරුණු නෙළුම් මල්වල සුවඳින් ලොව ප්‍රබෝධවත් වේ. අප ද ජීවත් විය යුත්තේ මඩ නො තැවරෙන නෙළුම් මෙනි. මඩ ගසන්නට වෑයම් කරන්නවුන් ගේ අත්වල මඩ තැවරෙනු ඇත. මඩ ගැන නොසිතා පිරිසිදු ජීවිත ගත කරන්නට අපි ඉටා ගනිමු.

මිනිසුන් අප වෙත රෝසමල් විසි කරතැයි බලා සිටිනවා වෙනුවට ඔවුන් අපට මඩ ගසතැයි සූදානමින් සිටියහොත්, මඩ ගසන අයගේ බලාපොරොත්තුව එනම් අප වේදනාවට, කම්පාවට පත්වීම ඉටු නොවනු ඇත. මෙය තරමක් අමාරු වැඩක් වුව ද එසේ කිරීම උපේක්ෂාවෙන් සියල්ල ඉවසීමේ උදාර ගුණය වගා කිරීමක් වනු ඇත. උපේක්ෂාව තරම් ආස්වාදනීය තත්ත්වයක් වෙනත් නැතිතරම් ය. ඉවරයක් නැති වාචාල කතා නින්ද,

අපහාස, චරිත ඝාතන මැද අපට හැකි උපරිම මට්ටමෙන් ලොවට හිත වැඩ කරමින් වාසය කරමු.

ලොව හොඳ මිනිසුන්ට ම නින්දා කිරීම, වධ දීම, වස දීම, වෙඩි තැබීම, කුරුසයට තබා ඇණ ගැසීම වැනි දේ සිදුවීම විස්මයජනක ය. සොක්‍රටීස් නැමැති මහාදාර්ශනිකායාට වස දෙන ලදි. ජේසු ක්‍රිස්තු නම් වූ ශාස්තෘවරයා කෲර අන්දමින් කුරුසයේ තබා ඇණ ගසන ලදි. අහිංසක මහාත්මා ගාන්ධි වෙඩි පහරින් මිය ගියේ ය. ''වැඩි හොඳත් නරකට හිටි''යි කියන්නේ මේ නිසා ද?

ඇත්තට ම, ජීවතුන් අතර සිටි අවදියේ ඔවුන් ලද්දේ නින්දා අපහාස ය. ඔවුහු වධ වේදනා දී කුරිරු ලෙස මරා දමනු ලැබූහ. මරණින් පසු ඔවුහු දේවත්වයෙන් පුදනු ලබති. ශ්‍රේෂ්ඨ උත්තමයෝ නින්දාව හා ප්‍රශංසාව යන දෙකින්ම නොකැළඹෙති. ඇණුම් බැණුම් , නින්දා අපහාස හෝ වධ වේදනාවලින් කම්පා නොවෙති. තම සේවය අගය කරනු ලැබීම හෝ නොලැබීම ගැන ඔවුන්ට ප්‍රශ්නයක් නැත. ඔවුන්ට වචන්නට මිස භුක්ති විඳින්නට වරම් නැත්තේ ය.





# ලද මොහොත අතහැර ගනිමු ද?

"සසුන් රුවන්" විසිනි

(මැදින් කලබ හා සබැඳේ)

රජය දැහැමි නොවීමෙන් කාලයත් සමඟ මිනිසුන්ගේ පරම ආයුෂ අවුරුදු විසිදහසකට අඩුවුණා. මේ කාලවකවානුව වන විට තවමත් සොරකමේ අඩුවක් දකින්නට ලැබුණේ නැහැ. එක් දවසක් එක්තරා මිනිසෙක් අන් කෙනෙකුගේ වස්තුව සොරා ගත්තා. එවිට තවත් පුදුගලයෙක් ඔහු ගැන රජතුමාට ප්‍රසිද්ධියේ අසවල් පුද්ගලයා සොරෙකැයි කියා කේලාම් කීවා. සොරා අරමුණු කර කේළාම් කියන්නට පෙළඹුණා. මේ විදිහට ධනය නොමැති අයට ධනය නොදීමෙන් දිළිදු බව ද සොරකම ද අයුධ දරමින් පර පණ නැසීම ද බොරු කීම ද කේළාම් කීම ද දවසින් දවස වර්ධනය වුණා මිස අඩු බවක් නම් වූයේ නැහැ. මේ ක්‍රියාකාර කම් නිසා මිනිසුන් ගේ ආයුෂ මෙන් ම වර්ණය ද තවත් පිරිහුණා. විසි දහසක් ආයුෂ ඇති මිනිසුන් ගේ දරුවන් අවුරුදු දස දහසක් ආයුෂ ඇත්තන් වුණා.

මෙලෙසින් පරම ආයුෂ දස දහසක් ඇති මිනිසුන් ගෙන් පිරිසක් බොහෝම ලස්සන පැහැ ඇත්තන් වුණා. දුර්වර්ණ පුද්ගලයන් වර්ණවත් ලස්සන අය දිහා සරාගී සිතින් බැලුවා. සරාගී සිතෙහි රාගී බව තවත් වැඩි වුණා. රාගයේ සීමා බන්ධන බිඳී ගියා. දුර්වර්ණ පුද්ගලයන් තුළ වැඩුණු අසීමිත රාග සිතිවිලි නිසා ලස්සන වර්ණවත් පර ස්ත්‍රීන් සමඟ කාම බන්ධනයට යට වෙලා කාමයෙහි වැරදි ලෙසින් (කාමමිථ්‍යාචාරයෙහි) හැසිරුණා. මෙසේ දිළිඳු බව වැඩි වීමෙන් සොරකම, ආයුධ යොදා පර පණ නැසීම, බොරුකීම, කේලාම් කීම  වර්ධනය වුණා. මේ කිලිටි චර්යාව නිසා ඒ මිනිසුන් ගේ ආයුෂ මෙන් ම වර්ණය ද තවත් පිරිහුණා. ආයුෂයෙන් ද පිරිහෙණ, වර්ණයෙන් ද පිරිහෙන, දස දහසක් ආයු ඇති මිනිසුන් ගේ දරුවන් අවුරුදු පන්දහසක් ආයුෂ ඇත්තන් වුණා.

කාලයත් සමඟ සිදුවෙන මේ ආයු වර්ණ පිරිහීම පිළිබඳව බොහෝ දෙනාට අවබෝධ කරගන්නට නොහැකි වුණා. ඒ පිළිබඳව නිරීක්ෂණය කිරීමට ඔවුන්ට අවශ්‍යතාවක් ඇති වුණෙත් නැහැ. වැඩි පුරම කාලය අනවශ්‍ය ලෙස අපතේ හැරියා. එකල මිනිසුන්ගේ වචන මාලාව තුළ බොහෝ විට පරුෂ වචන ඇතුළත් වුණා. කිසිදු වැදගත් කමක් නොමැති හිස් වචනත් කථා බහට ඇතුළත් වුණා. පරුෂ වචනයත් හිස් වචනයත් කියන මේ ධර්මතා මහත් ලෙසින් සමාජයේ වර්ධනය වුණා. මේ වැරදි දහම්වල වැඩීම නිසා තව තවත් මිනිස් ආයු වර්ණ පිරිහුණා. දිළිඳු බව ද සොර කම ද ආයුධ දැරීම ද පර පණ නැසීම ද බොරුකීම ද කේලම ද කාමයෙහි

වරදවා හැසිරීම ද පරුෂ වචනය ද හිස් වචන දෙඩීම ද යන මේ වැරදි ක්‍රීයාවන් ලොව බහුල වුණා. මේ අධාර්මික තත්ත්වයේ වර්ධනය සොබාදහමට තර්ජනයක් වුණා. පරුෂ වචනය හා සම්ඵප්පලාප යන දෙකරුණ නිසා පන්දහසක් අයු ඇති මිනිසුන් ගේ දරුවන් අවුරුදු දෙදහස් පන්සියයක් ද ඇතැම් දරුවන් අවුරුදු දෙදහසක් ආයුෂ ඇත්තන් ද වුණා.

(මතු සබඳී)

**(සූත්‍ර පිටකයේ දීඝ නිකායේ පාථික වග්ගයට අයත් චක්කවත්ති සීහනාද සූත්‍රයේ මිනිසුන්ගේ ආයුෂ පිරිහීම පිළිබඳ ව බුදු මුවින් වදළ දේශනාව අළලා සැකසෙන ලිපි පෙළකි.)**

සො සහස්සං සහස්සේන
සංගාමෙ මානුසෙ ජිනෙ
එකං ච ජෙය්‍ය අත්තානං
ස වෙ සංගාමජුත්තමො

(ධම්මපදය -සහස්‍ර වර්ගය)

යමෙක් යුද්ධයක දී දහසින් ගුණ කළ දහසක් හෙවත් දසලක්ෂයක් මිනිසුන් පරදවා ජය ගන්නේ නමුත් ඔහු උසස් ජයග්‍රාහකයෙක් නො වෙයි. යමෙක් එක ම තමා දිනා ගන්නේ නම්, හෙතෙම උසස් ම දිනුම් කරුවා ය.



# දහම් පාසල් තුළින් ස්ථාවර සුන්දර සමාජයක්

සිරි වජිරාරාමවාසී
ඥාණසීහ ස්වාමීන් වහන්සේ විසිනි

අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නා හිමියන් ගේ සංකල්පයක් මත පිහිටුවන ලද ධර්මවිජය පදනමේ ප්‍රධාන අරමුණ වන්නේ ''මිනිහාත් හද ගනිමින් රටත් හද ගනිමු'' යන සංකල්පය මත ධර්මවිජය සමාජ කේන්ද්‍ර කොට චතුර්විධ දියුණුවක්, එනම් ආර්ථික, අධ්‍යාපන, සෞඛ්‍ය හා සදාචාර යන අංශ යටතේ පූර්ණ වර්ධනයක් සමාජයේ ඇති කිරීම යි.

මෙහි දී පූර්ණ වර්ධනයක් ඇති වන්නේ එම අංශ හතරේම සමතුලිතතාවකින් යුතු දියුණුවක් ඇති වුවහොත් පමණි. සෑම රටක ම වර්ධන ක්‍රියාවලිය දෙස බලාගෙන යනවිට පෙනී ගොස් ඇත්තේ ආර්ථික අංශයේ හෝ අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවල හෝ වර්ධනයක් ඇති වීමෙන් සුන්දර සමාජයක් බිහි නොවන බව යි. සෑම දියුණුවක ම පදනම සදාචාරය හෙයින් සදාචාර වර්ධනයට සෙසු අංශවලට සමාන තැනක් දිය යුතු ය.

සදාචාර අංශ වැඩ පිළිවෙල යටතේ ප්‍රධාන අංශයක් වන්නේ දහම් පාසල යි. ශ්‍රී ලංකාවේ විහාරස්ථාන මුල්

කොට, දහම් පාසල් 8000 කට වැඩි සංඛ්‍යාවක් පත්වාගෙන යනු ලැබේ. ඒවායේ ඉගෙන ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව විසි ලක්ෂයකට ආසන්න ය. වෙන වචනවලින් කියතොත් බෞද්ධ සිසු සිසුවියන්ගෙන් 71% පමණ දහම් පාසල් යන බව ය. සාමාන්‍යය එසේ වුව ද අවුරුදු 10 ට අඩු බෞද්ධ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 80% ක් 85% ක් පමණ දහම් පාසල් යන බව දකිය හැකි ය. මෙතරම් විශාල ප්‍රතිශතයක් දහම් පාසල්වල අධ්‍යාපනය ලබා ගැනීම සමාජ සංශෝධන ක්‍රියාවලියේ ලා ඉතා ම වැදගත් සාධකයක් ලෙස සැලකිය යුතු ය.

අධ්‍යාපන මූලධර්ම අනුව, චරිත වර්ධනයේ ඉතාම වැදගත් කාල පරිච්ඡේදය වනුයේ මුල් වයස් කාලය යි. දැනට සොයා ගෙන ඇති විද්‍යා මත අනුව ළමයකුගේ චරිත වර්ධනය ළමයකු බිහිවීමටත් ප්‍රථම එනම් මව්කුසේ ඉන්නා කාලය තුළදී ම ආරම්භ වේ. මව සිතන පතන දේ මෙන් ම ඇයට අසෙන දකින දේ මව්කුසේ සිටින දරුවාට ද හැඟෙන බව නවීන විද්‍යානුකූල මතය යි. මෙය දැනසිටි අපගේ පැරැණියන් ගර්භනී අවස්ථාවේ මව් හා මව් ගැබ ආරක්ෂා කිරීමට විශාල වෙහෙසක් දරා ඇත. ආහාරපාන මෙන් ම මවගේ සිතේ ඇතිවන ආවේග පාලනය කර ගනිමින් යහපත් සිතුවිලි ඇති කර ගනිමින් රටට ජාතියට ආගමට ප්‍රයෝජනවත් දරුවකු බිහි කිරීම උසස්ම කාර්යයක් ලෙස සලකමින් ක්‍රියා කර ඇත. තිසරණ සහිත පන්සිල් ගැනීමේ දී පවා මව, තමාට මෙන්ම තම කුසේ සිටින බිළිඳාටත් වශයෙන්, දෙවිටක් පන්සිල් ගත් බව අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහා නා සමිඳුන්ගේ දේශනාවල දී අප අසා ඇත. අපේ දෙමව්පියන් ද එසේ කොට ඇත.

බෞද්ධ චින්තනය අනුව චරිත වර්ධනය ආරම්භ වන්නේ දරුවා මව්කුසේ සිටිය දී ය.

මුල් ළමා කාලයේ ළමයකුගේ චරිත වර්ධනයට විශාල වශයෙන් ම බලපාන්නේ ගෙදර පරිසරය යි. කුඩා දරුවා හය හතර, එනම් මිනිස් ලොව ඇතුළු සුගති හයටත් සතර අපායන්ටත් අදාළ කරුණු ඉගෙන ගන්නේ එම වයසේ දී ය. එනිසා සමාජයේ පූර්ණ වර්ධනයක් ඇති කිරීමේ දී පූර්වාචාර්යයන් (පුබ්බාචරිය) ලෙස දෙමව්පියන්ට අවශ්‍ය දැනුම හා ආකල්ප වර්ධනයක් ඇති කිරීමට සමාජය විශේෂයෙන් වෙහෙසිය යුතු ය. සෑම ගෙදරක් ම පෙර පාසලක් විය යුතු ය යන්න මහානාහිමියන් විසින් අවධාරණය කරන ලද්දේ එනිසා ය.

වර්තමානයේ පෙර පාසල් ක්‍රමයක් බිහි වී තිබෙතත් ආකල්ප වර්ධනයට වඩා ඉංග්‍රීසි ඇතුළු භාෂා හා සංඛ්‍යාත්මක දැනුම වර්ධනයට ඒවා කටයුතු කරනු ලබන බව දක්නට ලැබේ. පෙර පාසලේ දී සාක්ෂර ඥානය වර්ධනය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් පසුව දෛනික පාසලට ගිය විට දරුවාට අධ්‍යාපනික වශයෙන් බාධාවක් සිදුවන බව අධ්‍යාපනඥයන් විසින් පෙන්වා දී තිබේ. මේ කරුණු සලකා සදචාර සම්පන්න සමාජයකට අඩිතාලමක් දැමීමට ධර්මවිජය පදනම 'ළදරු සෙවණ' වැඩ සටහන දියත් කරන ලදී. එසේ වුව ද එම සංකල්ප අනුව පවත්වන ළදරු සෙවණවල් ඇත්තේ ධර්මවිජය සමාජ අතලොස්සක පමණි. බොහෝ දුරට දක්නට ලැබෙන්නේ අන්‍යාගමිකයන් පවත්වන පෙර පාසල් දෙස බලා ඒවා අනුකරණය කිරීමක් ය. දෙමව්පියන්ට නිසි අවබෝධයක් විහාරස්ථානය මගින්

ලැබෙන්නේ නම්, පිටස්තර ආටෝපයට වඩා ගුණගරුක සමාජයක අඩිතාලම වශයෙන් ළදරු ගුරු සෙවණ දකිනු ඇත. මෙවන් ආකල්පවල වෙනස්කම් ඇති කිරීම ධර්මවිජය සමාජයේ කාර්යභාරයක් ලෙස සලකනු ලැබේ.

ළදරුවාගේ වර්ධනයට විශාල වශයෙන් බලපානු ලබන්නේ ගෙදර පරිසරය යි. එයට මව හා පියා මෙන් ම ආච්චි, සීයා ඇතුළු වැඩිහිටි සහෝදර සහෝදරියන් ඇතුළත් ය. ගෙදර නමැති පෙර පාසලේ වැඩෙන දරුවා, දහම් පාසල් ප්‍රාථමික පන්තිවල දී ශ්‍රද්ධා ආදී ගුණාංගවලින් ඔප්නැංවීමට ක්‍රියා කරවීම ඉතා වැදගත් ය. දැහැමි ජීවිතයක බීජය ලෙස ශ්‍රද්ධාව සැලකෙන හෙයින් එය ළමා මනසේ රෝපණය කිරීමට දහම් පාසල් ප්‍රාථමික අංශයේ දී විශාල වෑයමක් දැරිය යුතු ය. පාඩම් පොත් ආශ්‍රය කරගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව මෙන් ම, කථාන්තර, චිත්‍ර හා ළමා මනසට ගැළපෙන අධ්‍යාපනික මෙවලම් මගින් බොදු දරුවකු තුළ වර්ධනය වී තිබිය යුතු ගුණාංග පුරුදු පුහුණු කිරීම ඉතා වැදගත් ය. අපට අවශ්‍ය වන්නේ පන්සිල් සුරකින සැදැහැවත් නව පරම්පරාවකි.

ඉහත සඳහන් කරුණු පදනම් කොට, දහම් පාසල්වල ප්‍රාථමික අංශයෙහි අධ්‍යාපන කටයුතු සකස් කිරීම ඉතා වැදගත් ය. චරිත වර්ධනය ඇති කැරෙන ළමා මනසට ඔබින වැඩසටහන් පළමු වසරේ සිට පස්වන වසර තෙක් දියුණු කළ යුතු ය. ඒ සඳහා එම පන්තිවල උගන්වන ආචාර්ය මණ්ඩලයට විශේෂ පුහුණුවක් ලබාදීම ඉතාම වැදගත් ය. දෛනික පාසල්වල ප්‍රාථමික ගුරුවරුන් සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වේ. එම වැඩ සටහන් උපයෝගි

කර ගනිමින් දහම් පාසලේ ප්‍රාථමික ශ්‍රේණිවල ගුරුවරුන්ට අධ්‍යාපන ක්‍රමවේද, මනෝ විද්‍යාව, ආදිය ඇතුළත් වැඩ සටහන් සකස් කොට පුහුණුවක් ලබා දීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය ආධාරක වශයෙන් ළමා වයසට ගැළපෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යය දියුණු කළ යුතුව තිබේ.

තවද දහම් පාසල් පරිසරය ද ළමා මනසේ ගුණ දහම් දියුණුවන ආකාරයට සකස් විය යුතු වේ. මල් ගොමු, තුරුලතා ආදියෙන් රමණීය වූ ඉතාමත් ආකර්ෂණීය පරිසරයක් සෑම විහාරස්ථානයකම තිබීම ඉතා වැදගත් ය. ආර්ථික වශයෙන් දුර්වල වුව ද තමන් ජීවත්වන පරිසරයට ගැළපෙන අයුරු එම වටාපිටාව සකස් කර ගැනීමේ හැකියාව සෑම විහාරස්ථානයකට ම ඇති බව කිව යුතු ය.

රටක් ජාතියක් සමයක් කරණ කො ට
තුවක්කුවට කඩුවට ගල්මුල්වල ට
ඉලක්කයක් වන්නට ඇත්නම් අප ට
සැපක් තමයි නො නිවෙන නිවනින් මෙ පි ට

ගිරි මත පැමිණ එකසර කෙසරිඳු සේ වී
සිරිබර පවර ජාතික ආලෙහි ගෑ වී
හරි පිරිමියකු මෙන් වැඩ නො කොළොත් පේ වී
සිරි ලක් මවට උඹ ණය ගැතියෙක් වේ වී

**- එස්. මහින්ද හිමි**



# අම්මා

සිය පණ ලෙස රෑ දහවල් එක ලෙස නිතියෙන් මා
රස කිරි දී අදර පපා මා ඇති කළ අම්මා
සොම් ගුණ පිරි සිනා රැල්ල තුඩු කොට මුව පෙම්මා
''නාඬන් පුතෙ දෙයිය'' කියා මා නැළවූ අම්මා

අඬමින් මා පයින් ළයට බැටදෙන නැති නිම්මා
මා පොඩි සිඹ ''හා හා පුත'' කියා සැනසූ අම්මා
සිතට කයට සැප නොතකා මා ගැන වෙසෙසින් මා
තොස වඩවන තරුණ වයස මා හට පිදු අම්මා

මෙහෙම හොඳයි මෙය නරකයි කියමින් ගුණ දම්මා
ඔවදන් දී පඬි සබයට මා සැරසූ අම්මා
ඔබ ගුණ කඳ සිහි කර කර ආදර බැතියෙන් මා
වඳිමි නිතර පා දෙක ඔබෙ පෙම්බර මගෙ අම්මා

ප්‍රකට කිවියකු හා වියතකු වූ, අධ්‍යාපන සඟරාවේ කර්තෘ ධුරය දැරූ යූ.ජී. පැටර්සන් ද සිල්වා සූරීන් විසිනි



# රුක්ඛධම්ම ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි

රෝහිණී නදිය කිඹුල්වත්පුර වැසියනට මහඟු ආභරණයක් වැන්න. එය එතරම්ම වටනේ ය. මන්ද? රෝහිණී නදිය කිඹුල්වත් පුර මැදින් ගලා බසිමින් මුළු පෙදෙසම සරු කරනා බැවිනි. එමෙන් ම පුරවැසියනට ගොවිතැනට සහාය වන බැවිනි. අස්වනු නෙළනා කාලයට ඔවුන්ගේ අස්වැන්න ඉතා සරුවිය. අටුකොටු පිරී ගියේ ය.

කිඹුල්වත්පුර වැසියෝ වංශ දෙකකට අයත් වූහ. ඒ ශාක්‍ය වංශය හා කෝලිය වංශයයි. මිතු දම් රැකි ශාක්‍ය හා කෝලිය වංශිකයෝ විරසක වූයේ රෝහිණී නදියේ ජලය බෙදා ගැනීමට ඇවැසි බව පවසමිනි. විරසකය සටනක් බවට පත්විය. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේහට මෙම සටන පිළිබඳ දැනගන්නට ලැබුණි. තමන් වහන්සේ හා නෑදෑ සබඳකම් ඇති මෙම ශාක්‍ය හා කෝලිය වංශිකයෝ සටන් කළහොත් මහා විනාශයක් වේ යැයි සිතූ බුදුරජාණන් වහන්සේ අහසින් වැඩමවා

රෝහිණී නදිය මත්තෙහි පලක් බැඳ වැඩ සිටි සේක. බුදුරජාණන් වහන්සේ ගඟ දියමැද වැඩ සිටිනා අයුරු දුටු නෑදෑයින් සංවේගයට පත් වූහ. ඉන්පසු රෝහිණී ගං ඉවුරට බැස සමගිව සිටීමෙන් ලබාගත හැකි ආනිසංස දක්වා රුක්ඛධම්ම ජාතකය වදාළහ.

තම නෑදෑයන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ශාක්‍ය, කෝලිය වංශිකයෝ රජ පෙළපතට අයත් බවත් තමන් නෑදෑයන් බැවින් සමගියෙන් විසිය යුතු බවත් වදාළ සේක. ගස් කොළන් පවා, සමගියෙන් ජීවත්වන බව නොපෙනේ දැයි නෑදෑයන්ගෙන් විමසූහ. පෙර කල හිමාලය පෙදෙසෙහි පිහිටි මහා සල් වනයෙක, සල්ගස්, වැල්, පැළෑටි එකිනෙකට බැඳී සිටි නිසා මහා සුළඟක් පැමිණිය ද බිම පතිත නොවූයේ ය. එහෙත් අතු පතර විහිදී ගිය මහා තනි ගස් ඇද වැටුණි. එබැවින් සමගිව සිටීමෙන් ලබාගත හැකි ආනිසංස, බුදුරජාණන් වහන්සේ අතීත කථාවක් ගෙන හැර දක්වමින් පෙන්වා දුන්හ.

පෙර බඹදත් නම් රජෙකු පාලනය කළ සමයෙහි පළමු වෙසමුණු රජු චුත විය. දෙවැනි වෙසමුණු රජු තමාගෙන් පසු උපන් පිරිසට කැමැති ස්ථානවල විමන් සාද ගන්නා ලෙස කීහ. එකල රුක් දෙවියෙකු ව සිටි අප මහ බෝසතාණෝ සල් වනයෙහි පමණක් විමන් තනා ගන්නා ලෙස දේවතාවනට දැන්වූහ. ගම් දනව්වල එළිමහනෙහි පිහිටි තනි ගස්වල විමන් නොගන්නා ලෙස දැන්වූහ. නුවණැති දේවතාවුන් වහන්සේලා මෙම අවවාදය පිළිගත්හ. සෙස්සෝ නොපිළිගත්හ.

දිනෙක මහ වැසි වසිමින් තද සුළං හමන්නට විය. සුළඟ කුණාටුවක් බවට පත්විය. මහා මුල් සහිත, එළිමහනේ තිබූ ගස් මුලින්ම උදුරා වැටුණි. සල් වනයෙහි එකිනෙකට බැඳී තිබූ ගස් ආරක්‍ෂා විය. එම ගස්වල වැඩ සිටි දේවතාවෝ අසරණ වූහ. වාස භවන් සොයා ගැනීමට නොහැකි විය. එසේ අතරමංවූ දේවතාවෝ සල්වනයට ගොස් බෝසතාණන් වහන්සේට මේ බව සැළ කළහ. එකට බැඳී එකමුතුව සිටිනා විට බාධා හමුවේ නො සෙල්වී සිටිය හැකි බැව් පෙන්වා දුන් පසුව නොපිළිගත් නිසා මෙසේ වී යැයි බෝසතාණෝ පෙන්වා දුන්හ.

මෙම ජාතක කථාව තම නෑදැයිනට වදරා නෑදෑයන් සමගියෙන් විසිය යුතු බවත් සමගිය ඇතිවිට සතුරනට ඉඩ නොලැබෙන බවත් පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ, එකල දේවතාවෝ මේ බුදුපිරිස ය, නුවණැති දේවතාවා තමන් වහන්සේ ම යැයි වදාළ සේක. මෙම ජාතකය සමගියේ බලය පෙන්වා දේ .



# ලොව විසිතුර

බලනු මැනැවි ළමයිනි පොඩි වේයා
සමඟි බලේ රැක වේගෙන්
පුංචි පුංචි මැටි ගුලි එක් තැන් කර
තුඹස බඳියි අභිමානෙන්

වැඩට පලට හරි දස්සයි උං නම්
නිදි නැත ගුලකට වී මෙන්
නිතර මැ දුව පැන කෑම සොයා යෙති
කුහුඹුවො රැජිනගෙ නාමෙන්

හෙළ දැය උරුම වූ පින් බර දරුවනි
වැඩපළ කර සහයෝගෙන්
කඩිසර වනු මැන සමඟි වැ දිරියෙන
අප සතු මවුබිම නාමෙන්

මී මැස්සා ඔබ කවුරුත් හඳුනති
ගුම් ගුම් රැං රැං නාදෙන්
මල්වල මුවරද විගසින් රැස් කොට
මීහි බැඳ ගන්නේ පේමෙන්

කුරුලු ලොවේ සැටි බැලුවත් එහෙමයි
උදයෙම කිචි බිචි ගාමින්
ගොදුරු සොයා යෙති හනික පියාඹා
පැටවුන් හට ඇති පේමෙන්

**- ඩී.පී.බී. ඇල්ලේපොල සූරීහු**



# ආචාර ධර්ම පිළිපදිමු

**විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මි කරුණානායක මහාත්මනිය විසිනි**

අම්මේ, අර කඩේ මුදලාලි මාමා හරි හොඳයි නේද? ඔව් පුතේ, ඒ මාමාගේ තියෙන හොඳ ආචාර ධර්මයි, උනන්දුවයි නිසා තමයි කඩේ දිනෙන් දින දියුණු වන්නේ.

අම්මේ, ආචාර ධර්ම කියන්නේ මොනව ද? පුතේ, කා සමගත් සුහදව හොඳ සිරිත් ඇතිව තමන්ටත් අනුන්ටත් හිත වැඩ පිණිස කටයුතු කිරීම යි.

අම්මේ, ඒක මට තව පැහැදිලි කරලා දෙන්න. පුතේ, ඔයා උදේ අවදි වූ මොහොතේ සිට නින්දට යන කාලය දක්වා කරන කටයුතු දකින බලන හැම දෙනගේ ම හිත සතුටුවන ආකාරයට කිරීම.

උදැසන අවදි වූ විට තමා නිදගත් ස්ථානය පිළිවෙළකට සකස් කිරීම. ආගම සිහිකර හිත සන්සුන් කර ගැනීම. තම සිරුර පිරිසිදු කරගැනීම. එම ස්ථාන ද පිරිසිදු කිරීම. ආහාර ගෙන දෙමාපියන් නැමද පාසල් ඒම, පාරේ දකුණු පැත්තෙන් ගමන් කිරීම. තමන්ට හමුවන අය

සමඟ සුහද ව සිනහ වීම. පාසලේ තමන්ට පැවරුණු බාහිර ක්‍රියාකාරකම් මෙන් ම ඉගනීමේ කටයුතු ද ඉතා උනන්දුවෙන් හා සතුටින් කිරීම.

අම්මේ, ආචාර ධර්ම පිළිපදින්නේ ළමයි විතරද? නෑ පුතේ, අපි කොයි කවුරුත් ආචාර ධර්මවලට ගරු කළ යුතුයි.

අපේ, බුදුහාමුදුරුවොත් ආචාර ධර්ම ගරු කරලා තියනවා. පුතේ, ඔයා ඉතිපිසෝ ගාථාව දන්නවා නේද? එහි එන නව අරහාදි බුදු ගුණවලින් තුන්වැනි බුදු ගුණය තමයි ''විජ්ජාචරණ සම්පන්න'' බුදු ගුණය.

බුදුහාමුදුරුවන් තුළ තිබුණු පසළොස් චරණ ධර්මයන් තමයි ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, පමණ දන ආහාර වැළඳීම, කුශලාකුශල කර්ම කෙරෙහි ඇති ශ්‍රද්ධාව, හිරි ඔතප්, බහුශ්‍රැත භාවය, වීර්ය, සිහිය, ප්‍රඥාව, ධ්‍යාන සතර.

මේ සියල්ල අපි පිළිපදිනවා නම් අප අතින් වැරදි සිදුවන්නේ නැහැ.

අපේ අතිපූජ්‍ය මඩිහේ සිරි පඤ්ඤාසීහ මහානාසමිඳුන් නිතර දේශනා කළ දෙයක් තමයි ''මිනිහා නො හද රට හදන්න බෑ, මිනිහාත් හදගනිමින් රටත් හද ගනිමු''කියලා.

ඉතින් අම්මේ කොහොමද? මිනිස්සු හදන්නේ. පුතේ, ගුණ ගරුක අම්මලාගේ දරුවන් නම් මවු කුසේ සිටම මනස දියුණු කර ගන්නවා. එසේ දියුණු කරන මිනිස්කම නිසා මිනිහා මනුෂ්‍යයන් අතර ශ්‍රේෂ්ඨත්වයට පත්

වෙනවා. මනස ඉහළට ම දියුණු කළොත් බුද්ධත්වයටත් පත් විය හැකියි. මහාබ්‍රහ්මයා බුදුවන්නට කැමති නම් මහා බ්‍රහ්මත්වය අත් හැර මිනිසකු වී බුද්ධකාරක ධර්මයන් පුරමින් මනස දියුණු කරගත යුතු යි.

පුතේ, අපේ ජාතක කථාවක් තියනවා මඝ මානවක ජාතකය කියලා. ඒ කතාවේ එන මඝ මානවක තරුණයා තුළ තිබුණු ආචාර ධර්මයි, දුර දක්නා නුවණයි, නිසා නපුරු දරුණු වැඩ කළ තරුණයන් තිස් දෙනෙකු සුමඟට යොමු කරල ගමත් රටත් හදලා තියනවා.

පුතේ ඇතැම් අය මේ තරම් උතුම් මනුෂ්‍යාත්මය නොසලකා හැර ක්‍රියා කිරීම මහ ම පිරිහීමක්. ඇතැම් මිනිසුන් අතර මිනිස්කම පිරිහී ඇති බව පෙනෙන්ට තියනවා. මෙයට හේතුව කුමක්දැයි සොයා බලා පිළියම් කරනවා විනා පුද්ගලයන්ට දෙස් පැවරීම හොඳ නැහැ.

බුදුහාමුදුරුවෝ වැරදී වැඩ කරන අයට පණවපු දරුණුම දඬුවම බ්‍රහ්ම දණ්ඩනය යි. ඒ කියන්නේ වැරදි පුද්ගලයා කතා බහෙන් සහ ඇසුරෙන් ඉවත් කර තැබීමයි.

ඒ වගේ අපත් අපේ සිතින් කයින් වන වැරදි ක්‍රියාවලට බ්‍රහ්ම දණ්ඩනය පනවා ගනිමු. අටලෝ දහමින් නොසැලී ඉදිරියට යමු.

**ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං**